KIDS GOD WORSHIP

www.kidworship.kr

# ස්තේපන්ගේ මරණය

-The Death of Stephen-



113Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේගේ නැවත නැගිටීමෙන් පසුව අපෝස්තුළුවරුන් වඩාත් කැපවීමෙන් දෙවියන්වහන්සේගේ වචනය වඩ වඩා දේශනා කරන්නට වුණා. එයින් බොහෝ දෙනා විශ්වාස කරන්නට පටන් ගත්තා. සභාව බලා ගැනීමේ වගකීම වෙනුවෙන් අපෝස්තුළුවරුන් 7 දෙනෙක් තෝරා ගත්තා. එයාලා අතුරෙන් එක්කෙනෙක් ස්තේපන්. ඔහු මහත් ඇදහිල්ලක් ඇති අයෙක්. ස්තේපන් කියන නමේ තේරුම ඔටුන්න විය.

**පොතේ ගුරා** ..........................................................................................



114Page

යේසුස්වහන්සේ මෙන්ම ස්තේපන්ද මිනිසුන් අතරේ පුදුම දේ සහ හාස්කම් සිදු කළා. සුව කළා. යක්ෂ ආත්ම දුරු කරනු ලැබුවා. මේ නිසා බොහෝ ජනතාව ස්තේපන් පසුපසින් එන්නට වුණා.

**පළමු රෝගියා** ස්තේපන් අනේ, මගේ කකුල රිදෙනවා! කරුණාකර මගේ කකුල සුව කරන්න.

**රොගීන්** ස්තේපන්, මාව සුව කරන්න! මටත් සනීප නෑ, (වේදනාවෙන් සිටින ශබ්ද ඇසේ).

**ස්තේපන්** ස්වාමිනි, මේ මිනිසුන්ට කරුණාව දක්වා ඔවුන්ව සුව කරන්න.

**පොතේ ගුරා** මේ ආකාරයට රෝගීන් සම්පූර්ණයෙන්ම සුව වුණා. දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන්, ස්තේපන් දේවවචනය මිනිසුන්ට පැහැදිළිව කියා දුන්නා. තව වැඩි වැඩියෙන් මිනිසුන් ස්තේපන් පසුපස ආවා.



115Page

**පොතේ ගුරා** ස්තේපන්ට ඊර්ෂ්‍යා කරපු මිනිසුන්, එක් දවසක්, වැඩිමහල්ලන් සහ ව්‍යවස-ථාව උගන්වපු අය ළඟට ගොස් බොරු කියනවා.

**මිනිසා** ස්තේපන්, දෙවියන්වහන්සේ සහ මෝසෙස් ගැන ජනතාවට බොරු උගන්-වනවා.

**ජුදෙව් නායකයෙක්** මොකක් ?! යන්න, මේ දැන්මම ස්තේපන් අල්ලාගන්න !!

**පොතේ ගුරා** ස්තේපන්, සෙන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවට ගෙනාවා. සෙන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවේ අසුන්ගෙන සිටි සියලු දෙනාම ඇසිපිය නොහෙලා ස්තේපන් දෙස බලා සිටියා. ඒත් ස්තේපන්ගේ මුහුණ දේව දූතයෙක්ගේ මුහුණ වගේ බැබළුණා.

..........................................................................................



116Page

**පළමු මිනිසා** ස්තේපන්, දෙවියන්වහන්සේටත් මෝසෙස්ටත් අපහාස කරනවා, අපිට ඇහිලා තිබෙනවා!

**මිනිස්සු** ඔව්, ඒක හරි !

**පොතේ ගුරා** දෙවියන්වහන්සේගේ වචනය කඩ කළොත්, ජුදෙව් ආගමට අනුව ඒ කාලයේදී දඬුවම වූයේ ගල් ගසා මරණයට පත් කිරීමයි. ස්තේපන්ට ඊර්ෂ්‍යා කළ සහ වෛර කළ අයටත් අවශ්‍යය වුණේ, ස්තේපන්ව ගල් ගසා මරා දමන්නයි. යුදෙව් ආගම උගන්වන්නන් සහ වැඩිමහල්ලන් ස්තේපන්ගෙන් මෙහෙම අසනවා.

**ජුදෙව් නායකයෙක්** මේ චෝදනාවන් ඇත්තක්ද?

**පොතේ ගුරා** ස්තෙපන් බය වුණේ නෑ. ඔහු ආත්ම විශ්වාසයෙන් යුතුව දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන්න පටන් ගත්තා.



117Page

**ස්තේපන්** සහෝදරවරුනි, පියවරුනි, මට ඇහුම්කන්දෙන්න!

මිනිසුන් උදෙසා යේසුස්වහන්සේ කුරුසියේ මැරුණා. මෝසෙස්ගේ ව්‍යවස්ථාව ලැබුණු නුඹලාවත් එයට කීකරු වුණේ නෑ. කිසි පාපයක් නොකළ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නුඹලා විසින් මරා දමනු ලැබුවා.

**පොතේ ගුරා** මේක ඇසූ මිනිසුන් කෝපයෙන් පුපුරන්න පටන් ගත්තා. ඒත්, ස්තේපන් ඔවුන් බය වුණේ නෑ. ශුද්ධාත්මයෙන් පිරුණු ස්තේපන් ස්වර්ගය දෙසට ඇස් ඔසවා කියනවා:

**ස්තේපන්** බලන්න ස්වර්ගය ඇරී තිබෙනවා මට පේනවා, යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ සිටගෙන සිටිනවා!

**පොතේ ගුරා** මේ ඇසූ සියල්ලෝ මහ හඬින් කෑ ගසමින් ස්තේපන් ළඟට දුවගෙන යනවා. ඔවුන් ස්තේපන්ව නගරයෙන් පිටතට ඇදගෙන ගොස් ගල් ගසන්නට පටන් ගත්තා.

**ගල්ගැසූ 1 මිනිසා** ස්තේපන් ඔයා බොරුකාරයෙක් !!! ආග්ග්ග් !!!

**ගල්ගැසූ 2 මිනිසා** ඔයා දේව අපහාසිකයෙක් !

**ගල්ගැසූ 3 මිනිසා** ඔයා නම් මරන්නම සුදුස්සෙක් තමයි!!

**පොතේ ගුරා** ස්තේපන් දණ නමා යාච්ඤා කළා.

**ස්තේපන්** ස්වාමිනි, මගේ ආත්මය බාරගත මැනවි. මේ පාපය ඔවුන්ට විරුද්ධව නොතැබුව මැනව!!

..............................................................................................



118Page

**පොතේ ගුරා** මේ ආකාරයෙන් ස්තේපන් මිය ගියා. ස්තේපන් මිය යන තුරුම දෙවියන්වහන්සේගේ වචනය දේශනා කළා. මුල් සභාවේ ජීවිතය මරණයට පාවා දුන්න පළමු මිනිසා ස්තේපන් බවටද පත් වුණා.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, යේසුස්වහන්සේට අපහාස විදිහට කතා කරන අයට ඇහුම්කන් දුන්නාම, බය වෙන්න එපා. එයාලා කියන දේ අහන්නත් එපා. ඔයා විශ්වාස කරන දේ තදින් අල්ලගෙන ඉන්න.